අධිකරණ, රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා,පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
நீதி, பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் தொழில் அமைச்சு
Ministry of Justice, Public Administration, Home Affairs, Provincial Councils, Local Government and Labour

රාජ්‍ය පරිපාලන අංශය (ඒකාබද්ධ සේවා) பொது நிருவாகப் பிரிவு (இணைந்த சேவைகள்) Public Administration Division (Combined Services)
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

| | | | |
|---|---|---|---|
| දුරකතනය<br>தொலைபேசி: 011- 2696211<br>Telephone | ෆැක්ස්<br>தொலைநகல்: 011- 2695279<br>Fax | ඊ- මේල්<br>மின்னஞ்சல்: info@pubad.gov.lk<br>E-mail | වෙබ් අඩවිය<br>இணைத்தளம்: www.pubad.gov.lk<br>Web Site |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/DOS/Policy/පොදු | ඔබේ අංකය<br>உமது இல<br>Your No | PSC/EST/06-05/03/2015 | දිනය<br>திகதி:<br>Date | 2024.10.02 |

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම්/ උසස් කිරීම් සම්බන්ධ කටයුතු කඩිනමින් අවසන් කිරීම</u>**

සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම/ උසස් කිරීම සම්බන්ධ කටයුතු පහත කරුණු හේතුවෙන් ප්‍රමාද වන බව මා විසින් නිරීක්ෂණය කර ඇත.

I. ආයතන ප්‍රධානීන් විසින් නිලධාරීන්ගේ උපාධි ප්‍රතිඵල සනාථ කර ගැනීමේ කටයුතු ප්‍රමාද වීම.

II. සේවය ස්ථිර කිරීමේදී හා උසස් කිරීමේදී ඉදිරිපත් කල යුතු ලේඛන හා ආකෘති නිසි පරිදි ඉදිරිපත් නොවීම.

- 2020.01.01 දිනට පෙර සංවර්ධන නිලධාරී සේවයට පත් කළ නිලධාරීන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා මගේ අංක CS/DOS/Policy/පොදු/01 හා 2022.06.29 දිනැති ලිපියේ උපදෙස් අනුව එහි දක්වා ඇති CS/DOS/Con/Recom/2022 ආකෘතිය මඟින් අදාල ලිපි ලේඛන ඉදිරිපත් කල යුතුය.
- 2020.01.01 දින හා ඊට පසුව සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා PA/CS/POLICY/Guidelines හා 2020.08.24 දිනැති ලිපියේ උපදෙස් අනුව CSC-I හා CSC-II ආකෘති සහ ඊට අදාල අනෙකුත් ලිපිලේඛන ඉදිරිපත් කල යුතුය.
- 2013 වර්ෂයේ හෝ ඊට පසු සංවර්ධන නිලධාරී සේවයට බඳවාගත් නිලධාරීන් සාමාන්‍ය කාර්යය සාධනය මත IIශ්‍රේණියට උසස් කිරීම සඳහා මගේ අංක CS/DOS/Policy/පොදු හා 2023.05.12 දිනැති ලිපියේ උපදෙස් අනුව එහි දක්වා ඇති ආකෘතිය සමඟින් අදාල ලිපි ලේඛන ඉදිරිපත් කල යුතුය.
- සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ගේ ශ්‍රේණිගත උසස් කිරීම් සම්බන්ධව මගේ අංක CS/DOS/අන්තර්ග්‍රහණය හා 2020.07.20 දිනැති ලිපියේ උපදෙස් අනුව එහි දක්වා ඇති CS/DOS/PRO/APP අයදුම්පත සමඟින් අදාල ලිපි ලේඛන ඉදිරිපත් කල යුතුය. (මෙහි සඳහන් ලිපිලේඛන හා ඇමුණුම් සියල්ල මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ සංවර්ධන නිලධාරී සේවයට අදාල වෙබ් පිටුවේ විශේෂ නිවේදන යටතේ දක්වා ඇත.)

III. පත්වීම ස්ථිර කිරීමට/උසස් කිරීමට ඉදිරිපත්වන ලිපි අනුව අවශ්‍ය ලේඛන/තොරතුරු ඇති අවස්ථාවන්හිදී ඒ පිළිබඳව වෙබ් අඩවියේ පළ කර ඇතත් එම ලේඛන/තොරතුරු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමට ඉතා දීර්ඝ කාලයක් ගත වීම. (සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ගේ ආයතනික කටයුතු සඳහා අවශ්‍ය එවැනි ලේඛන/තොරතුරු මෙම අමාත්‍යාංශයේ වෙබ් පිටුවේ නිවේදන යටතේ දක්වා ඇත.ඊට අදාල සබැඳිය https://www.pubad.gov.lk/web/images/contents/cs-services/dos/dos-deficiencies-in-the-doc-submitted-for-confirmation-promotion-other-organizational-matters.pdf වේ.)

IV. පත්වීම් ලද පසු නම් වෙනස් කිරීමකදී ඉදිරිපත් කල යුතු ලේඛන (සංශෝධිත උප්පැන්න සහතිකය, දිවුරුම් ප්‍රකාශය, අදාළ භාණ්ඩාගාර 394 ප්‍රකාශය) ප්‍රමාද වී ඉදිරිපත් කිරීම.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2023 අනුව යම් නිලධාරියෙකුට තමා දැනට සිටින ශ්‍රේණියට වඩා ඉහළ ශ්‍රේණියක කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා පෙනී සිටිය නොහැකි අතර ඉහත හේතු මත නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරිමේ/ උසස් කිරීමේ කටයුතු ප්‍රමාද වීමෙන් නිලධාරීන්ට නිසි අවස්ථාවේදී කාර්යක්ෂමතා කඩඉම් විභාගයට ඉදිරිපත් වීමට නොහැකි වීම හා වෙනත් දුෂ්කරතා රැසකට මුහුණ පෑමට සිදු වී ඇති අවස්ථා නිරීක්ෂණය වී ඇත.

03. එම නිසා නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරිමට/උසස් කිරීමට අදාළ ලේඛන නිසි පරිදි ඉදිරිපත් කිරිම අදාළ විෂයභාර නිලධාරියාගේ හා එම ආයතනික කටයුතු භාර මාණ්ඩලික නිලධාරීන්ගේ වගකීමක් බව මෙයින් අවධාරණය කරන අතර, එසේ නිසි පරිදි ලේඛන ඉදිරිපත් නොවීම මත කිසියම් නිලධාරියෙකු අගතියට පත් වේ නම් ඒ සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ට වගකීම පැවරෙන බව කාරුණිකව දන්වා සිටිමි.



එස්.ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්